ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023-01-09 |

පැමිණිලි පාර්ශවය : ස්වර්ණමාලී අනුරාධනායක මිය,
අංක : 3038/ඒ, III පියවර,
අනුරාධපුරය.

වගඋත්තර පාර්ශවය : 01. මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක,
මූලස්ථාන පොලිස් ස්ථානය,
අනුරාධපුරය.

02. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය,
අනුරාධපුරය.

පැමිණිලි අංකය : **HRC/ANU/279/2021**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, ජංගම රථවලින් සහ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයෙන් සිදුවන ශබ්ද දූෂණය හා පීඩාව සම්බන්ධයෙන් අනුරාධපුර පොලිසියට හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත පැමිණිලි කර ඇතත්, මේ දක්වා එම පැමිණිලි සම්බන්ධයෙන් විසඳුමක් ලබාදීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග පොලිසිය විසින් ගෙන නොමැති බවත්, එමඟින් තම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්ය.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

අනුරාධපුර මූලස්ථාන පොලිස් ස්ථානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අංක HQI/ANP/OW/5049/2021 දරණ වාර්තාව මඟින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ සඳහන් කරුණු සම්බන්ධයෙන් තම පොලිස් ස්ථානයේ පරිසර ඒකකයේ ස්ථානාධිපති වෙතින් වාර්තාවක් කැඳවන ලද බවත්, අනුරාධපුර පොලිස් වසම ආවරණය වන

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පරිදි නිලධාරීන් යොමු කරමින් ශබ්ධ විකාශන යන්ත්‍ර මඟින් බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් ජංම වෙළඳාම් වල යෙදෙන පුද්ගලයින් සම්බන්ධයෙන් තොරතුරු පරික්ෂාවට ලක් කර ඇති බවත්, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් ජංගම වෙළඳාම් වල නිරත වන එම ප්‍රදේශයේ අයවලුන් දැනුවත් කර මින් ඉදිරියට මහජනතාවට හිරිහැරයක් නොවන අයුරින් තම ජංගම වෙළඳාම් කටයුතු සිදුකරන ලෙසටත්, ඔවුන්ට විරුද්ධව ලැබෙන පැමිණිලි සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවටත් දන්වා ඇති බවය.

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, උතුරුමැද දිසාවගේ ප්‍රකාශය :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් S/DIG/NCP/C/100/2002/295/22 යටතේ වාර්තාවක් යොමු කරමින් ඉහත වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරිය විසින් පොලිස්පතිතුමා ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේදී නිලධාරීන් වෙත ලිඛිත පැමිණිලි ඉදිරිපත් කර ඇති බවත්, එම පැමිණිලි සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදී විමර්ශන සිදුකරන ලද බවත්ය. මෙම විමර්ශනයන්හිදී අදාළ පුද්ගලයින්ට අවවාද කිරීමටත්, අවවාද පිළිනොගන්නා එම ක්‍රියාවේ යෙදෙන පුද්ගලයින් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමටත්, කටයුතු කර ඇති බවය. ඒ අනුව 2021 ඔක්තොම්බර් මාසයේදී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් ජංගම වෙළඳාමේ යෙදෙන පුද්ගලයින් දෙදෙනෙකුටත් නොවැම්බර් මාසයේ දෙදෙනෙකුටත්, දෙසැම්බර් මාසයේ දෙදෙනෙකුටත් නඩු පැවරීම සඳහා කටයුතු කර ඇති බව දක්වා ඇත. මීට අමතරව දෛනික රාජකාරියේ යෙදෙන නිලධාරීන් සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ජංගම වෙළඳ රථ රියදුරන් සහ ව්‍යාපාර හිමියන් දැනුවත් කිරීම ක්‍රියාත්මක කර ඇති බවද දක්වා ඇත.

එමෙන්ම පැමිණිලිකාරිය පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී ප්‍රායෝගික ගැටළු රාශියකට මුහුණදීමට සිදුව ඇති බවද දක්වා ඇත.

මෙම පැමිණිලිකාරියගේ පදිංචි ප්‍රදේශයේ තවත් විශාල ජනතාවක් පදිංචිව සිටින නමුත් එම කිසිවෙකුගෙන් මෙම සිදුවීමට අදාළව කිසිදු පැමිණිල්ලක් වාර්තා වී නොමැති බවත්, ආගමික ස්ථානවල සිදුකරනු ලබන ආගමික වැඩසටහන් සඳහා පොලීසිය විසින් යම් බාධා කිරීමක් සිදුකළහොත් එමඟින් රටතුළ පවතින ආගමික සංහිඳියාවටද යම් බලපෑමක් එල්ල විය හැකි බවද දක්වා ඇත.

මෙම පැමිණිල් සම්බන්ධයෙන් පාර්ශව කැඳවා කොමිෂන් සභාවේදී පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කළ මුත් ඉහත වගඋත්තරකාර පාර්ශවයන් පරික්ෂණය සඳහා පැමිණ නැත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මඟින් ප්‍රධානකොටම ප්‍රකාශ කර ඇත්තේ, තම ප්‍රදේශයේ පවතින ශබ්ධ දූෂණය සම්බන්ධයෙන් ඉහත වගඋත්තරකරුවන් වෙත පැමිණිලි ඉදිරිපත් කළද, මෙතෙක් එම පැමිණිලි

සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ශබ්ද දූෂණය නැති කිරීමට කටයුතු නොකිරීමෙන් තම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි.

මේ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, ශබ්ද දූෂණය අවම කිරීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත් බවත්, තවදුරටත් ගනිමින් සිටින බවත්, මෙම කටයුත්ත සිදුකිරීමේදී ආගමික සංහිඳියාවට බලපෑමක් එල්ල විය හැකි බවත්ය.

පැමිණිලි පාර්ශවය තම පැමිණිල්ල සහ විරෝධතා ගොනු කිරීම මඟින් පෙන්වා දී ඇත්තේ, තම ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින ශබ්ද විකාශන යන්ත්‍ර හා ජංගම වෙළඳ රථවල ක්‍රියාකාරීත්වය හේතුවෙන් පොදුවේ ශබ්ද දූෂණයන් සිදුවන බවත්, මෙම ශබ්ද දූෂණය හේතුවෙන් පැමිණිලිකාරියගේ මෙන්ම පොදු මහජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවන බවත්ය.

මෙලෙස සිදුවන ශබ්ද දූෂණ පිළිබඳව පැමිණිලිකාරිය අනුරාධපුර මූලස්ථාන පොලීසිය, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, අනුරාධපුර හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අනුරාධපුර වෙතට සහ මධ්‍යම පරිසර අධිකාරිය හා මහ නගර සභාව, අනුරාධපුර වෙත පැමිණිලිකර ඇති බවත්, අදාළ වාහන අංක හා වැඩිදුර තොරතුරු පැමිණිලි මඟින් ලබා දී ඇති බවටත් කරුණු නිරීක්ෂණය වේ.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අනුරාධපුර විසින් කොමිෂන් සභාව වෙත එවා ඇති ඉහත වාර්තාවට අනුව ශබ්ද දූෂණය අවම කිරීම සඳහා පියවර ගෙන ඇති බවටත්, නමුත් ශබ්ද දූෂණය තවදුරටත් පවතින බවටත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුගේ වාර්තාවට අනුව, අනුරාධපුර ප්‍රදේශයේ විශාල ජනතාවක් පදිංචි වී සිටින බවටත්, නමුත් එම පදිංචිකරුවන්ගෙන් ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගැනීම හා ශබ්ද විකාශන යන්ත්‍ර යොදාගෙන සිදුකෙරෙන ජංම වෙළඳාම සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් ලැබී නොමැති බවත් දක්වා ඇත.

මෙම කරුණු අනුව, පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් රටේ පවත්නා යම් ලිඛිත නීතියක සඳහන්ව ඇති වරදක් සිදුකරනු ලබන බවට පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් ස්ථානයක් වෙත පැමිණිලි ලැබී තිබේ නම් එම පැමිණිල්ල සම්බන්ධ ඇති වරදකරුවන් සොයා අදාළ නීතීන් ක්‍රියාත්මක කිරීමට පොලීසිය වෙත බලය ලැබී ඇති බවටත්, අදාළ වරද සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් ලැබී නොමැති අවස්ථාවක වුවද, පොලිස් නිලධාරියෙකු ඉදිරියේ සිදුකරනු ලබන සංඥය වරදක් ලෙස සලකන නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතින බවටත් පැමිණිල්ලක් ලැබී ඇත යන්න හා ප්‍රදේශයේ අනෙක් ජනතාව මේ පීඩාව පිළිබඳව පැමිණිලි නොකර තිබීමත් යන කරුණු පාදක කොට පැමිණිලිකාරියගේ පැමිණිල්ල සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොකර සිටීමට වඋත්තරකරුවන්ට

කිසිදු අයිතියක් නොමැති බව මහජන පීඩා/ශබ්ද දූෂණයට සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති පහත සඳහන් ලේඛන අනුව නිරික්ෂණය කරමි.

1 මෝටර් රථ ප්‍රවාහන පනත (160) වන්තිය

2 පොලිස්පති චක්‍රලේඛ 2086/08 } 2008.08.20
අපරාධ චක්‍රලේඛ 24/2008

3 ශබ්ද විකාශන යන්ත්‍ර පරිහරණය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ නඩුව 38/2005

4 පොලිස් අඥා පනත 80 වගන්තිය.

5 චක්‍රලේඛ 2031/07

6 දණ්ඩ නීති සංග්‍රහය 261 වගන්තිය

'ශබ්ද විකාශන යන්ත්‍ර හෝ ඒ හා සමාන උපකරණ භාවිතා කිරීමෙන් නිකුත් වන ශබ්ද මඟින් ශබ්දය නියුක්ත පරිසරයේ ජීවත් වන මහජනතාවට හෝ පදිංචිකරුවන්ට අපහසුතාවයක් කරදරයක් ඇති වීම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 261 වගන්තිය යටතේ මහජන පීඩාවක් සෙ සලකනු ලැබේ' යනුවෙන් සඳහන් වේ.

මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී, පැමිණිලිකාරිය පදිංචි ප්‍රදේශය තුළ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ඇයට සිදුවන අපහසුතාවය හෝ කරදරය පිළිබඳව අනුරාධපුර මූලස්ථාන පොලීසියේ ප්‍රධාන පොලිස් පරික්ෂකවරයාගේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා දක්වා පවතින නිල නාමයන් වෙත ලිඛිතව දන්වා ඇත. ඒ අනුව මෙම කරදරය හා පීඩාව සම්බන්ධයෙන් මහජන පීඩා ඇති කරන්නන්ට එරෙහිව කටයුතු කිරීමේ නීතිමය ප්‍රතිපාදන සැලසී ඇති බව නිරික්ෂණය වේ.

මේ අනුව පොලිස් ආඥා පනතේ 80(1) වගන්තිය යටතේ නිකුත් කර ඇති ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර අවලංගු කිරිමට හැකිය. මෙම වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රයන් රෙගුලාසි උල්ලංඝනය නොවන පරිදි ක්‍රියාකරන්නේද යන්න හා කොන්දේසි තරයේ ක්‍රියාත්මක වන්නේද යන්න පරික්ෂා කිරීමට නීතිමය ප්‍රතිපාදන පොලීසිය සතුව ඇත.

ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 261 වගන්තිය යටතේ දක්වා ඇති වැරදි පිළිබඳව යම් පුද්ගලයින්ට විරුද්ධව කරනු ලබන පැමිණිලි හා පොලිස් ආඥා පනතේ 80(1) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ශබ්ද විකාශන යන්ත්‍ර ඇම්ලිෆයර් හෝ වෙනත් උපකරණ භාවිතා කිරිම සම්බන්ධයෙන් නිකුත් කරන ද බලපත්‍ර කොන්දේසි හා උපදෙස් උල්ලංඝනය කරමින් භාවිතා කරන බවට කරනු ලබන පැමිණිලි, සටහන් කර ගැනීමටත්, ඒ පිළිබඳ විමර්ශනය කිරීමටත්, එම කොන්දේසි උල්ලංඝනය කරන පුද්ගලයන්ට එසේ නොකරන ලෙස අවවාද කිරීමටත් ක්‍රියාකළ යුතු බවටත්, පොලිස් ආඥා පනත 80(4)

උප වගන්තිය යටතේ එම භාණ්ඩ හා උපකරණ පොලිස් භාරයට ගෙන රඳවාගෙන මෙම සිද්ධි පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී වෙත බව පොලිස්පති චක්‍රලේඛ 2031/2007 මගින් දන්වා ඇත.

පැමිණිලිකාරිය විසින් ශබ්ද පීඩාවන් සිදුකරනු ලබන පාර්ශවයන් පිළිබඳව අදාළ අයගේ නම් හා ස්ථානයන් පිළිබඳව මූලස්ථාන පොලිස් පරීක්ෂකගේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දක්වා පැමිණිලි කර ඇති අතර, තවදුරටත් ශබ්ද අපහසුතාවයක් හා පීඩාවක් සිදුකර ඇති පුද්ගලයින්ගේ ශබ්ද විකාශන යන්ත්‍ර පොලිස් භාරයට ගෙන ඇති බවට කිසිදු තොරතුරක් නොමැති බව පැමිණිලිකාරිය සඳහන් කර ඇත.

පොලිස්පති චක්‍රලේඛ 2031/2007 හි 8 ඡේදයේ 8.1 සිට 9.4 දක්වා වන කරුණු මගින් සෑම ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රයක්ම පොලිස් 307 පෝරමය ප්‍රකාරව නිකුත් කළ යුතු බවටත්, බලපත්‍රයේ දැක්වෙන කොන්දේසි වලට අමතරව පහත දැක්වෙන කොන්දේසි බලපත්‍රය සමඟ බලපත්‍රලාභියා වෙත නිකුත් කළ යුතු බවත් සඳහන් වේ.

මෙම කරුණු හා පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ කරුණු සලකා බැලීමේදී,

8.1 ශබ්ද විකාශන යන්ත්‍ර නිකුත් කරනු ලබන පරිශ්‍රයේ සීමාවෙන් ඔබ්බට එම ශබ්දය විස්තාරනය නොවන ලෙසට වගබලා ගත යුතු වේ යන්නත්,

8.2 ශබ්ද විකාශන යන්ත්‍රයේ ශබ්දය අදාළ පරිශ්‍රයට පමණක් සීමා විය යුතු බවටත්,

8.3 ශබ්ද පරිමාව මහජනතාවට හිරිහැරයක් ඇති නොවන පරිදි අවම මට්ටමින් පවත්වාගෙන යා යුතු බවටත්,

8.6 ශබ්ද විකාශන යන්ත්‍ර මගින් මහාමාර්ගයේ රථවාහන ගමනාගමනයට එමෙන්ම මහජනතාවට අවහිරයක් අපහසුතාවයක් කරදරයක් වන අයුරින් කටයුතු නොකළ යුතු බවටත්, ආදී වශයෙන් 2031/2007 චක්‍රලේඛයේ වැඩිදුරටත් උපදෙස් දී ඇතත්, පැමිණිලිකාරිය විසින් පොලීසිය වෙත යොමුකර ඇති පැමිණිල්ලට අනුව ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පැමිණිලිකාරියට සිදුව ඇති අපහසුතාවය මගහරවා එම අයගේ පැමිණිල්ලට යුක්තිය ඉටුකරදීමට ප්‍රමාණවත් තරම් නීතිමය ප්‍රතිපාදන පැවතියදී එම ප්‍රතිපාදන වගඋත්තරකරුවන්විසින් නොසලකා සිටින බවත් නිරීක්ෂණය කළ හැකි වේ.

වගඋත්තරකරුවන් තම වාර්තාව මගින් පෙන්වා දී ඇත්තේ, ශබ්ද දූෂණ සම්බන්ධයෙන් විශාල ජනතාවක් අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිව සිටි නමුත් පැමිණිලිකාරිය හැරුනු විට වෙනත් කිසිවෙකුත් ශබ්ද දූෂණයට එරෙහිව පැමිණිලි කර නොමැති බවත්, මෙම ශබ්ද දූෂණය අනුරාධපුර ප්‍රදේශයේ පමණක් නොව දිවයින පුරාම පවතින තත්වයක් වන බවත්ය.

ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් සිදුවන අපහසුතාවය සහ කරදරයන් මැඩ පැවැත්වීම සඳහා පොලීසිය වෙත මාර්ග උපදේශනයන්/චක්‍රලේඛනයන් නිකුත් කර ඇත්තේ මුළු දිවයිනටම බ පැවැත්වෙන පරිදි වන අතර, මෙම චක්‍ර ලේඛනය මඟින් පොදුවේ උපදෙස් ලබා දී ඇති බවටත්, ශබ්ද දූෂණ වැළැක්වීම සඳහා කණ්ඩායම් පැමිණිලි පමණක් අවශ්‍ය වන බවට කිසිදු පෙන්වාදීමක් නොමැති අතර, තනි පැමිණිල්ලක් මත නීතිය ක්‍රියාවට නැංවීමට ඉහත චක්‍රලේඛනය මඟින් උපදෙස් ලබාදීම සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

දෙපාර්ශවය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති ලේඛන සලකා බැලීමේදී ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් සිදුවන අපහසුතාවයන් හා කරදරයන් සම්බන්ධ තනි පැමිණිල්ලක් මත පදනම්ව වුවද එම අපහසුතාවය හා කරදරය ඇති කරන පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා පොලීසිය සතුව ප්‍රමාණවත් නීතිමය ලේඛන පවතින අතර, එම නීතිමය ලේඛන පදනම්ව අනුරාධපුර ප්‍රදේශය තුළ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් සිදුවන කරදරයන් හා අපහසුතාවයන් වළක්වා ගැනීමට හැකියාවක් පවතී.

නමුත් වගඋත්තරකරුවන් විසින් පොලිස් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ඇති මෙකී නීතිමය ප්‍රතිපාදන කොයිතරම් දුරට ක්‍රියාවට නංවා තිබේද යන්න ගැටළුවක් වන අතර, එසේ ක්‍රියාවට නංවා නොසිටීමට ඔවුනට ඇති අයිතිය පිළිබඳ ප්‍රශ්නාර්ථයක් මතු කරයි.

**නිගමනය :-**

ඒ අනුව ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතාව හේතුවෙන් සිදුවන ශබ්ද දූෂණය වළක්වා ගැනීමට හැකියාව තිබියදී වගඋත්තරකරුවන් විසින් එම හැකියාව ප්‍රයෝජනයට නොගෙන සිටීම තුළ පැමිණිලිකාරියගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාවේ සඳහන් නීතිය පසිදලීම ක්‍රියාත්මක කිරීම හා එහි රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේය යන මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතාව හේතුවෙන් සිදුවන ශබ්ද දූෂණය වළක්වා ගැනීමට පවතින නීතිමය ප්‍රතිපාදන අනුව පියවර ගන්නා ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 02.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
පරිසර අමාත්‍යාංශය,
'සොබාදම් පියස'
416/සී/1, රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුරය.

B/